**2020 වර්ෂයේ අ.පො.ස (උ.පෙළ) විභාගයෙන් සමත්ව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයට තේරී පත් වූ සිසුන් සඳහා වන 2020/2021 අධ්‍යයන වර්ෂය 2022 ජනවාරි මස 01 වන දින ආරම්භ කිරීමට නියමිතය. මෙම ලිපිය පළ කෙරෙනුයේ ඊට සමගාමීවයි.**

ශ්‍රී ලංකාවේ ශාස්ත්‍රීය ප්‍රබෝධයේ මුදුන්මල් කඩක් වූ විද්‍යෝදය පිරිවෙණ ඇසුරින් ප්‍රතිෂ්ඨාපනය වූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය එදා මෙදා තුර ශ්‍රී ලාංකේය උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රමුඛස්ථානයක් දිනා සිටියි. එම විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය තම යුග මෙහෙවරෙහි තවත් පියවරක් සනිටුහන් කරමින් 2022 නව වසර ආරම්භයත් සමග නව අධ්‍යයන වර්ෂයෙහි අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට නියමිතය.

2020 වර්ෂයේ උසස්පෙළ විභාගයේ ප්‍රතිඵල මත ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ උපාධිය හැදෑරීම සඳහා ලියාපදිංචි වී ඇති සිසුසිසුවියන් වෙනුවෙන් වන නම්නීකරණ වැඩ සටහන 2022 ජනවාරි මස 01 සහ 02 යන දිනවල මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පැවැත්වීමට නියමිත ය.

පීඨයේ සියලුම වර්ෂවල සිසු දරුවන්ගේ නව අධ්‍යයන වාරයේ දේශන 2022 ජනවාරි මස 03 වන දින සිට ආරම්භ කිරීමට නියමිත ය. රටේ පැවති අයහපත් සෞඛ්‍ය වාතාවරණය මත වුවද පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දැඩි කැපවීම සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහයෝගය මත ශ්‍රී ලාංකේය රාජ්‍ය විශ්වවිද්‍යාලවල 2020/2021 අධ්‍යයන වර්ෂය ආරම්භ කිරීමේ පුරෝගාමියා වීමට මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයට හැකි වීම විශේෂ භාග්‍යයක් කොට සලකමි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය විද්‍යෝදය පිරිවෙන ලෙස ආරම්භ වී ඇති අතර එම යුගයේ සිටම මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා විෂය ක්ෂේත්‍රවල අධ්‍යයන කටයුතු සිදුකර ඇති බවට සාක්ෂි ඇත. 1977 වර්ෂයේ බිහි වූ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ, ශාස්ත්‍රපීඨය ලෙස පවත්වාගෙන යනු ලැබූ අප පීඨය 2012 වර්ෂයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය ලෙස නාමකරණය වී දැයේ අවශ්‍යතා අනුව නව ගමනකට පිවිස ඇත.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය නව ප්‍රවණතා අනුව අභිවර්ධනය වී ඇති ආකාරය සංක්ෂිප්තව සනිටුහන් කරනු කැමැත්තෙමි. මේ වනවිට පීඨයේ, අපරාධවිද්‍යා, ආර්ථික විද්‍යා, දේශපාලන විද්‍යා, මානව විද්‍යා, සමාජවිද්‍යා, ඉතිහාසය හා පුරාවිද්‍යා, සිංහල හා ජනසන්නිවේදන, දර්ශනය හා මනෝවිද්‍යා, ඉංග්‍රීසි හා වාග්විද්‍යා, සංගීතය හා නිර්මාණාත්මක තාක්ෂණවේදය, භාෂා, සංස්කෘතික අධ්‍යයන හා ප්‍රාසාංගික කලා, භූගෝලවිද්‍යා, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, පාලි හා බෞද්ධ අධ්‍යයන හා සමාජ සංඛ්‍යාන ආදි අධ්‍යයන අංශ ක්‍රියාත්මක වේ. මේ අධ්‍යයනාංශ මගින් මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා අධ්‍යයන ක්ෂේත්‍ර 34ක් ආවරණය කරමින් උපාධි පිරිනැමේ. එම උපාධි සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පවත්වාගෙන යනු ලැබේ. තවද, ඉංග්‍රීසි භාෂා

ඉගැන්වීම් කටයුතු වෙනුවෙන් වෙනම අධ්‍යයනාංශයක් ලෙස, ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ අධ්‍යයනාංශය (Department of English Language Teaching – DELT) ක්‍රියාත්මක වේ.

"අධ්‍යාපනය තුළින් ජීවිත සංවර්ධනය" යන විශ්වවිද්‍යාලයීය දැක්ම අනුව යමින් විශ්වවිද්‍යාල වරම් නො ලැබූ සිසු සිසුවියන් වෙනුවෙන් බාහිර උපාධි පාඨමාලා තුනක් ද ක්‍රියාත්මක වේ. සැමට අධ්‍යාපන අවස්ථා ලබාදීමේ අරමුණින් ඩිප්ලෝමා පාඨමාලා 30ක් පමණ පීඨයෙන් පිරිනමනු ලැබේ.

මෙසේ විවිධ අධ්‍යයනාංශ යටතේ නව උපාධි පාඨමාලා ගණනාවක් හඳුන්වාදීමට හැකිවුයේ අභ්‍යන්තර විද්‍යාර්ථීන් වෙනුවෙන් අප පීඨය යටතේ පවත්වාගෙන යන පාඨමාලා 800කට වැඩි ප්‍රමාණයක සියලුම විෂය නිර්දේශ සංශෝධනය කිරීමට සමගාමීව ය. 21 වන සියවසට ගැළපෙන ආකාරයෙන් සහ නව ලොවට ගැළපෙන සබුද්ධිකභාවයෙන් සහ කුසලතාවෙන් යුතු, ඒකාබද්ධ ඉගෙනුම් ඵලවලට (Integrated Learning Outcomes-ILO) ගැළපෙන ලෙස විෂය නිර්දේශ සංශෝධනය කිරීම මූලික වශයෙන් සිදු කිරීමෙනි. ඒ යටතේ මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධිය, සමාජ වෘතවේදය පිළිබඳ උපාධිය, දර්ශනය සහ මනෝවිද්‍යාව පිළිබඳ උපාධි දෙකක්, සංචාරක හා උරුම කළමනාකරණය පිළිබඳ උපාධිය යනාදී වශයෙන් නව උපාධි පාඨමාලා කිහිපයක් ම හඳුන්වාදෙනු ලැබ ඇත. එසේම විද්‍යාවේදී සහ ශාස්ත්‍රවේදී තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධි ද්විත්වයක්ද, භූ අවකාශීය තාක්ෂණය පිළිබඳ උපාධියක්ද (Geo Spatial Technology) අභිනව උපාධි පාඨමාලා ලෙස හඳුන්වා දී තිබේ. තවද, නව ලොව ජය ගැනීම උදෙසා භාෂා පිළිබඳ ඥානය අත්‍යවශ්‍ය වන හෙයින් ප්‍රංශ භාෂාව පිළිබඳ ගෞරව උපාධියක් ද, චීන සහ ජපන් භාෂා පිළිබඳ ගෞරව උපාධි පාඨමාලා ද හඳුන්වා දී ඇති අතර සංගීතය සහ නිර්මාණාත්මක තාක්ෂණ උපාධිය යනුවෙන් නව මානයකට යොමු කරනු ලැබූ ගෞරව උපාධි පාඨමාලාවක් ද එක් කර ඇත.

එසේම පීඨයේ පැවති අධ්‍යයන පාඨමාලා ව්‍යුහය ද මෑතකාලීනව සංශෝධනයට ලක්විය. ඒ අනුව සෑම අර්ධ වාර්ෂිකයකටම අදාළව ඉංග්‍රීසි විෂය සඳහා වන සම්භාර අගය (Credits) ප්‍රමාණය 2 සිට 9 දක්වා ඉහළ දමනු ලැබ ඇති අතර ඉංග්‍රීසි විෂය ඉගෙනීම අනිවාර්ය බවට පත්කර ඇත. තොරතුරු තාක්ෂණ විෂයය ඉගෙන ගැනීමේ අත්‍යවශ්‍යතාව හේතුකොට ගෙන එහි සම්භාරක අගය 3 සිට 8 දක්වා ඉහළ දමා ඇත. සේවා නියුක්තිය (Employability) පිළිබඳ විශේෂ අවධානය යොමු කිරීම මෙවැනි සංශෝධන සඳහා මූලික වශයෙන් හේතු වූ බව සඳහන් කළ යුතු ය. අවසන් වසරේ ඉගෙනුම ලබන ගෞරව උපාධි හදාරන සිසුන් ආයතනික පුහුණුවීම් (Internship) සඳහා යොමුකිරීමට පෙර වර්තමාන ආයතනික ලෝකයේ (Corporate world) පවත්නා නව ප්‍රවණතා පිළිබඳ පුහුණුවක් ලබා දීම ද පීඨයෙන් සිදු කෙරේ. මෙහිදී විද්‍යාර්ථියකුට ඇවැසි නම් ව්‍යවසායකයෙක් ලෙස හෝ ඉදිරියට පැමිණීමට අවශ්‍ය දැනුම සහ පුහුණුව අප පීඨයෙන් ලබා දීමට කටයුතු සලසා ඇත. එසේම ගණිතය, සාමාන්‍ය දැනීම සහ ශ්‍රී ලංකා සමාජය වශයෙන් විෂයයන් කිහිපයක් ද

අනිවාර්ය විෂයයන් ලෙස දක්වා ඇත්තේ අධ්‍යාපනයේ නව මානයක් කරා විද්‍යාර්ථීන් රැගෙන යාම අවශ්‍ය බව අවබෝධ කරගෙන ඇති හෙයිනි.

මෙයට අමතරව ඩිජිටල් අධ්‍යාපන සහ වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය (Centre for Digital Education and Professional Development –CDEPD) අභිනවයෙන් පිහිටුවන ලදී. මෙම මධ්‍යස්ථානය, ඩිජිටල් අධ්‍යාපන, සම්පත් සැපයීම, විවිධ පරාසයක පාඨමාලා හා පාඨමාලා ඒකක ලබා දීම, වෘත්තීය සංවර්ධනය, තොරතුරු තාක්ෂණ සේවා සහ විද්‍යුත් ඉගෙනුම් කටයුතු ලෙස මූලිකව අංශ හතරක් යටතේ ක්‍රියාත්මක වේ. ඒ අනුව, ඉංග්‍රීසි හා ව්‍යවහාරික දෙමළ ඩිප්ලෝමා පාඨමාලා, මානසික සංවර්ධන වැඩසටහන්, වෘත්තීයමය ජීවිතය සඳහා තොරතුරු තාක්ෂණය, පර්යේෂණ ක්‍රමවේදය ආදි වැඩසටහන් ද, විශේෂ වැඩමුළු මෙන්ම බාහිර දේශන අභ්‍යන්තර සිසු දරුවන් වෙනුවෙන් සංවිධානය කරනු ලැබේ. තවද, කොවිඩ් 19 වාතාවරණයේදී හඳුන්වා දුන් මාර්ගගත ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ආචාර්යවරුන් පුහුණු කිරීමේ වැඩසටහන් සහ පාඨමාලා ද මෙම ඒකකය මගින් ආරම්භ කර ඇත. තවද, Brilliants Mind නමින් වූ අභියෝග්‍යතා සංවර්ධන වැඩසටහන ප්‍රධාන ධාරා දෙකක් ඔස්සේ ක්‍රියාත්මක වේ. බහුවිධ බුද්ධි අභියෝග්‍යතාව ඉන් එකකි. එමගින් උපාධි අපේක්ෂකයන් තුළ වෘත්තීය තරග විභාග සඳහා මුහුණ දීමට සාමාන්‍ය දැනුම හා ගණිතමය කුසලතා වර්ධනය කිරීම අපේක්ෂිත ය. දෙවැන්න ‘සුභාෂා’ වැඩසටහනයි. මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ උපාධිය හදාරණ සිසුන්ගේ සිංහල භාෂා හැකියාව වර්ධනය කිරීම එහි මුඛ්‍ය අභිප්‍රාය වේ. මෙම මධ්‍යස්ථානයේ ව්‍යවසායකත්ව අධ්‍යයන ඒකක මගින් වැඩමුළු ගණනාවක් පවත්වමින් ව්‍යවසායකත්ව කුසලතා වර්ධනය කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශ ලබා දේ. වාර්ෂිකව පවත්වන නව්‍ය ව්‍යාපාරික අදහස් (Business Idea) තරගාවලියෙන් තෝරා ගනු ලබන හොඳම අදහස් සහිත උපාධි අපේක්ෂකයන්ට ස්වකීය අදහස ව්‍යාපාරික ලෝකයෙහි රෝපණය කිරීම සඳහා ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරිය වැනි රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශ, බැංකු වැනි මූල්‍ය ආයතන සම්බන්ධ කර ගැනීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක වේ. එමගින් වැඩිදුර පුහුණුව සහ නිසි උපදෙස් ලබා ගැනීමේ අවකාශය ඔවුන්ට හිමි වේ. තවද, විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන කාලයේදී ම ව්‍යවසායකත්වය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාවක් හැදෑරීමේ අවස්ථාවක් ද හිමි කර දී ඇත. මෙහි දී දැකිය හැකි විශේෂත්වය වන්නේ මෙම පීඨයේ විද්‍යාර්ථීන්ට සිය උපාධිය අවසන් කිරීමට ප්‍රථම ඉංග්‍රීසි හා ව්‍යවහාරික දෙමළ ඩිප්ලෝමා පාඨමාලා ද්විත්වය ම හිමි කර ගැනීමේ අවස්ථාව උදා වීමය. එමෙන්ම මේ වන විට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨවල ඉගෙනුම ලබන විද්‍යාර්ථීන් උදෙසා තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාවක් ලබා දීමට කටයුතු කරමින් පවතින අතර ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් හා මානව සම්පත් මේ වන විටත් පීඨය මගින් සම්පූර්ණ කරගෙන ඇත. මීට අමතරව පුස්තකාල සහ විඥාපන සහතිකපත්‍ර පාඨමාලාවක්ද මෙම වර්ෂයේදී හඳුන්වාදීමට නියමිතය.

තවද, විශේෂ අවශ්‍යතා ඇති සිසුන්ගේ අධ්‍යයන තත්ත්වය හා සුබසාධනය ඉහළ නැංවීම සඳහා ද විශේෂ ශිෂ්‍ය මධ්‍යස්ථානයක් හා ඊට අදාළ ව විවිධ ව්‍යාපෘති දියත් කර ඇති අතර 'කථන ග්‍රන්ථ' ව්‍යාපෘතිය ඉන් ප්‍රමුඛස්ථානය ගනී. එමගින් සිදුවන්නේ දෘශ්‍යාබාධිත සිසුන්ට අවශ්‍ය කෘති ශ්‍රවණ මාධ්‍යයට පරිවර්තනය කිරීමයි. 'Dream' ශිෂ්‍යත්ව ක්‍රමය දියත් කෙරෙනුයේ ද ඔවුන් වෙනුවෙනි. මේ හැරුණු කොට පරිසර හිතකාමී ලෝකයක් වෙනුවෙන් සැකසුණු විවිධ වැඩසටහන්වලින් යුතු 'හරිත කේන්ද්‍රය', ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් 'ස්ත්‍රී-පුරුෂ සමාජභාවයේ සමානාත්මතාව සහ සාධාරණත්වය පිළිබඳ කේන්ද්‍රය', පීඨ අධ්‍යයන හා ශිෂ්‍ය ප්‍රජාවගේ සාහිත්‍ය හා ශාස්ත්‍රීය ප්‍රකාශන දිරි ගැන්වීම් සහ ඒ පිළිබඳ දැනුම පුළුල් කිරීමේ අභිප්‍රායෙන් ක්‍රියාත්මක වන 'පීඨ ප්‍රකාශන කමිටුව', ශිෂ්‍ය උපදේශනය හා සුබසාධනය වෙනුවෙන් ස්ථාපිත 'ශිෂ්‍ය උපකාරක මධ්‍යස්ථානය' ආදි තවත් බොහෝ අනු ඒකක අප පීඨයෙහි ස්ථාපිත කර ඇත. මේ සඳහා මූලිකත්වය ගෙන කටයුතු කිරීමට ඇවැසි සහයෝගය ලබා දෙන්නේ ද අප පීඨයේ ආචාර්යවරුන් ම ය. ශාස්ත්‍රීය පර්යේෂණ සඳහා පීඨ ප්‍රජාව නැඹුරු කිරීමේ අරමුණ පෙරදැරිව පීඨයේ 'බහුවිෂයයික අධ්‍යයනය පිළිබඳ ජාත්‍යන්තර පර්යේෂණ මධ්‍යස්ථානය'(International Center for Multidisciplinary Studies ) පිහිටුවා ඇත. ඒ අනුව වාර්ෂිකව පර්යේෂණ සැසි කිහිපයක්ම විවිධ තේමා යටතේ සංවිධානය කෙරේ. 'විද්‍යෝදය උපාධි අපේක්ෂක පර්යේෂණ දිනය' අපගේ විද්‍යාර්ථීන්ගේ පර්යේෂණ ඉදිරිපත් කිරීම වෙනුවෙන්ම සැකසුණු වේදිකාවකි.

පීඨයේ සිසුන්ගේ කලා හා සංස්කෘතික හැකියා ඔප්නැංවීමේ අරමුණින් පිහිටුවා ඇති 'පීඨ සංස්කෘතික කමිටුව, ප්‍රසංග හා නිර්මාණාත්මක තරගාවලි අංශය, ශාස්ත්‍රීය ප්‍රකාශන අංශය, සංගීත සහ රසවින්දනාත්මක අංශය, ප්‍රසාංගික කලා අංශය, සංස්කෘතිය හා ජාතික උරුමය පිළිබඳ අංශය යන ප්‍රධාන තේමා යටතේ ක්‍රියාත්මක වේ. 'රන්රසු ප්‍රතිභා අභිනන්දන කලා මංගල්‍යය' ද අප විද්‍යාර්ථීන්ගේ නිර්මාණාත්මක කලා හැකියාවන් වර්ධනය කිරීම සහ ඇගයීම වෙනුවෙන් වාර්ෂිකව සංවිධානය කරනු ලබන්නේ පීඨ සංස්කෘතික කමිටුව විසිනි. විද්‍යාර්ථීන්ගේ අධ්‍යාපන කුසලතා ඇගයීම සඳහත් ප්‍රජානායකත්ව, ව්‍යවසායකත්ව, මෘදුකුසලතා සහ නිර්මාණාත්මක කුසලතා ඇගයීම සඳහාත් පීඨාධිපති ඇගයීම් සම්මාන ඇතුළු විවිධ සම්මාන සහ ස්වර්ණ මුද්‍රිකා පිරිනැමීමද වාර්ෂිකව විවිධ අවස්ථාවලදී සිදු කෙරේ. ඒ අනුව අප විශ්වවිද්‍යාලයීය මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයෙන් උපාධිය සම්පූර්ණ කරනුයේ විවිධ යෝග්‍යාවස්ථා මගින් සිය දැනුම, ආකල්ප සහ කුසලතා වර්ධනය කරගත් විද්‍යාර්ථීන්ය.

2020/2021 අධ්‍යයන වර්ෂය ආරම්භ වන මෙම වර්ෂය වනවිට ශ්‍රී ලාංකේය විශ්වවිද්‍යාලයවල මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා විෂයයන් ඉගැන්වීම ආරම්භ වී වසර 100ක් සපිරුණු විශේෂ සන්ධිස්ථානයක් සනිටුහන් කර ඇත. නව ප්‍රවණතා සහ නව මානයන් අනුව යමින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා විෂය ක්ෂේත්‍රය සකස් වී ඇත්තේ නව ලොවට ගැළපෙන පරිදි විවිධ ඉසව් ස්පර්ශ වන අයුරිනි. සමාජයේ පවතින ගතානුගතික සහ සාම්ප්‍රදායික

රාමුවෙන් මිදී 21 වන සියවසට උචිත විෂය ක්ෂේත්‍රයක් බවට මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා විෂය ක්ෂේත්‍රය පත්කිරීමට අප පීඨයට හැකිවීම අප ලද විශාල ජයග්‍රහණයකි. අති මහත් සතුටකි. ඒ අන් කිසිවක් නිසා නො ව දැනුම, ආකල්ප, කුසලතා මත පදනම් ව වෘත්තීය දක්ෂතාවෙන් යුතු නව දැනුමින් සන්නද්ධ යාන්ත්‍රික නො වූ විද්‍යාර්ථීයකු බිහි කිරීමට ලැබීමේ සතුට යි.

මහාචාර්ය ශිරාන්ත හීංකෙන්ද
පීඨාධිපති
මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය